**කැලණිය අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2017**

10 ශ්‍රේණිය | රෝමානු කතෝලික | කාලය : පැය 3

නම : ..............................................................................................

## 1 පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් ගණන
1) 36 කි. 2) 39 කි. 3) 46 කි. 4) 66 කි.

02. ශුද්ධ බයිබලයේ එළිදරව්වාදී සාහිත්‍යයට අයත් කෘති දෙක වනුයේ,
1) හිතෝපදේශය හා එළිදරව්ව පොත 2) ලෙවී ව්‍යවස්ථාව හා ප්‍රඥාව පොත
3) දානියෙල්ගේ පොත හා එළිදරව්ව පොත 4) ගීතාවලිය හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත

03. බැබිලෝනීය විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ ආගමික හා සමාජීය ප්‍රතිස්ථාපනය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කරන පොත් දෙකකි,
1) තෝබිත් හා නෙහෙමියා 2) එස්රා හා නෙහෙමියා
3) ජුදිත් හා එස්තර් 4) එස්රා හා තෝබිත්

04. ලූක් ශුභාරංචිය හා ක්‍රියාපොත පිළිගන්වා ඇත්තේ ................. නම් තැනැත්තාටය.
1) තියෝපිලස් 2) ප්‍රොකරස් 3) යුතිකස් 4) ස්තේපන්

05. ඉතිහාසඥයෙකි, වෛද්‍යවරයෙකි, චිත්‍ර ශිල්පියෙකි, ලේඛකයෙකි. මෙසේ දක්වෙන ශුභාරංචි කතුවරයා,
1) ශු. පාවුලුතුමාය. 2) ශු. මතෙව්තුමාය. 3) ශු. මාර්ක්තුමාය. 4) ශු. ලූක්තුමාය.

06. නව ගිවිසුමට අයත් හසුන් සංඛ්‍යාව
1) 8 කි. 2) 13 කි. 3) 21 කි. 4) 27 කි.

07. ද්විතීය පාවුලු සංදේශ වනුයේ,
1) එපීස හා කොලොස්සි 2) රෝම හා ගලාති
3) 2 තිමති හා තීතස් 4) ගලාති හා පිලිප්පි

08. එළිදරව්වාදී සාහිත්‍යයේ ලක්ෂණයකි,
1) සංකේත භාවිතය 2) උපමා රූපක යොදා ගැනීම.
3) භාෂා ශෛලය සරල වීම 4) දේවත්වය ආරූඪ කිරීම.

09. ක්‍රි.ව. 80 - 96 අතර කාලයේ රෝම අධිරාජ්‍යයේ කිතුනුවන්ට එරෙහිව දරුණු පීඩනයක් පැවති සමයක එළිදරව්ව ග්‍රන්ථය රචනා වී ඇත. එවකට පාලකයා වූයේ
1) IV ඇන්ටියෝකස් අධිරාජ්‍යයා 2) ඩොමීෂියන් අධිරාජ්‍යයා
3) නීරෝ අධිරාජ්‍යයා 4) වැලේරියන් අධිරාජ්‍යයා

10. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පමණක් සඳහන් වන පිළිතුර වනුයේ,
1) ජෝබ් - ගීතාවලිය - එස්රා - නෙහෙමියා 2) ගීතාවලිය - ප්‍රේම ගී - ධර්මදේශකයා - සිරාක්
3) ප්‍රඥාව - සිරාක් - මලාකි - ජුදිත් 4) ජොෂුවා - එස්රා - ධර්මදේශකයා - ගීතාවලිය

Remove Watermark Now

11. අත්අඩංගුවට ගත් ජේසුස් වහන්සේව ජුදයන් පළමුව රැගෙන ගියේ,
1) ගලීලය භාර පාලකයා වූ හෙරෝද් වෙතය.
2) ජුදයේ ආණ්ඩුකාරයා වූ පිලාත් වෙතය.
3) ජුදා මන්ත්‍රණ සභාව වෙතය.
4) උත්තම පූජකයාගේ මැදුර වෙතය.

12. ජේසුස් වහන්සේට කුරුසිය රැගෙන යාමට උදව් කළේ,
1) අරිමතියාවේ ජෝශප් ය.
2) සිරේනියේ සීමොන් ය.
3) විනයධරයකු වූ නිකදේමුස් ය.
4) අරිමතියාවේ සීමොන් ය.

13. උත්ථානයෙන් පසු ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දෙදෙනෙකුට දර්ශනය වූයේ ................ බලා යමින් සිටියදී ය.
1) ජෙරුසලම
2) ගලීලය
3) එම්මාවුස්
4) නාසරත්

14. අපෝස්තුළුවරුන්ට පවි කමාවේ බලය දානය කරන ලද්දේ,
1) පාස්කු ඉරුදිනය.
2) ගොබ් ඉරුදිනය.
3) මහ බ්‍රහස්පතින්දාය.
4) ස්වර්ගාරෝහණයට පෙරය.

15. "මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි" යනුවෙන් ජේසුස් ස්වාමින් වහන්සේ වෙත ප්‍රබල විශ්වාසය ප්‍රකාශ කළේ,
1) ශු. පේදු[illegible]
2) ශු. පාවුලු තුමා
3) ශු. තෝමස් තුමා
4) ශු. ස්තේපන් තුමා

16. ජුදයෝ තම අස්වැන්නේ නැඹුල් ඵල ඔප්පු කරමන් දෙවි[illegible] සිහිමට ජෙරුසලම් දේව මාළිගයට රැස්වූ මංගල්‍යය වනුයේ,
1) පාස්කු මංගල්‍යය
2) කුඩාරම් මංගල්‍යය
3) කානික්ක මංගල්‍යය
4) පෙන්තකොස්ත මංගල්‍යය

17. මුල් කිතුනු සභාවේ සහනාධාර බෙදීම සඳහා තෝරාගනු ලැබූ පිරිස හඳුන්වනු ලැබූ නාමය
1) උපස්ථායකයන්
2) සහනාධාරකයන්
3) තේවාචාරීන්
4) සහයවන්නන්

18. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා,
1) ශු. ජාකොබ් තුමා
2) ශු. ස්තේපන් තුමා
3) ශු. පේදුරු තුමා
4) ශු. ජොහාන් තුමා

19. සාවුල්ට ප්‍රසාද ස්නාපනය දානය කළේ,
1) බර්ණබස් ය.
2) සීලස් ය.
3) අනනියස් ය.
4) පිලිප් තුමාය.

20. පළමු ධර්මදූත චාරිකාවට පාවුලුතුමන් සමඟ සහභාගී වූයේ,
1) ලූක්තුමා හා බර්ණබස් ය.
2) සීලස් හා තිමෝති ය.
3) බර්ණබස් හා ජොහාන් මාර්ක් ය.
4) සීලස් හා ලූක්තුමා ය.

21. "බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැයි" යනුවෙන් ජේසුතුමන්ගේ ශ්‍රාවකයකු වීමට ආරාධනා ලැබුවේ,
1) ශු. තෝමස් තුමාය.
2) ශු. පාවුලු තුමාය.
3) ශු. පේදුරු තුමාය.
4) ශු. පිලිප් තුමාය.

22. "පේදුරු" යන නමෙහි අර්ථය වනුයේ,
1) සභාව
2) පර්වතය
3) ප්‍රධානියා
4) එඬේරා

23. "මොවුන් ගැන පමණක් නොව මොවුන්ගේ වචනය කරණකොට ගෙන මා අදහාගන්නා අය ගැනත් යාච්ඤා කරමි." මෙසේ සඳහන් වන යාච්ඤාව වනුයේ,
1) මරියතුමියගේ උදාන ගීය
2) සුරදූත ගීය
3) ස්වාමිවාක් ආරාධනාව
4) උත්තම පූජක යාච්ඤාව

24. "කතෝලිකත්වය" යනුවෙන් හඳුන්වනු ලබන්නේ ශු. සභාව සතු
1) විශ්වීය බව
2) සාධාරණත්වය
3) ධර්මදානිය බව
4) පරිත්‍යාගශීලි බව

25. අපෝස්තුළුවරයා යන්නෙහි අරුත
1) යවනු ලැබූ තැනැත්තා යනුයි.
2) දෙවියන්ගේ මිත්‍රයා යනුයි.
3) දෙවියන්ගේ ශ්‍රාවකයා යනුයි.
4) ඉගෙනුම ලබන තැනැත්තා යනුයි.

26. ලන්දේසීන්ගේ දහම වූයේ,
1) කතෝලික දහම
2) රෙපරමාදු දහම
3) ක්‍රිස්තියානි දහම
4) එංගලන්ත සභාව

pdfelement
papers.lk

27. ලන්දේසි පාලන සමයේ කිතු දහම ආරක්ෂා කර ගැනීමට පුරෝගාමී වූ ධර්මදූත නිකාය වනුයේ,
1) ප්‍රැන්සිස්කාන නිකාය
2) දොමිනිකාන නිකාය
3) ජේසු නිකාය
4) ඔරතෝරියානු නිකාය

28. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ ම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය." යනුවෙන් තම ජීවිතයේ අවසන් වදන ප්‍රකාශ කළේ,
1) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා
2) දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
3) අසීසියේ ප්‍රැන්සිස් තුමා
4) ජුසේවාස් පියතුමා

29. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන් විසින් රචිත කෘතියකි.
1) වේද කාව්‍යය
2) සුභාෂිතය
3) සිරිත් මල්දම
4) මංගල සිරිත

30. වත්මන් ශ්‍රී ලංකාවේ රදගුරු පදවි ගණන
1) 8 කි.
2) 9 කි.
3) 11 කි.
4) 12 කි.

31. "දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය" නමින් හඳුන්වනු ලබන්නේ,
1) ප්‍රසාද ස්නාපනය
2) අභිවෘධි ආලේපය
3) දිව්‍ය සත්ප්‍රසාදය
4) පූජාත්වරය

32. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණක් නොවන්නේ,
1) මෙල්කිසදෙක්ගේ යාගය
2) මන්නා භෝජනය
3) සීනයි ගිවිසුම
4) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය

33. යුදා පාස්කු මංගල්‍යයේ භෝජන පිළිවෙතෙහි .................... සුවිශේෂී විය.
1) මිදියුෂ
2) පාස්කු බැටළුවා
3) නුමුහුන් රොටී
4) තිත්ත පලා

34. ජොහාන් සුභාරංචියේ පමණක් සඳහන් වන සිද්ධියකි.
1) පාස්කු භෝජන පිළිවෙත
2) පන්දහසකට කෑම දීම
3) මල් උයනේ යාච්ඤාව
4) ශ්‍රාවකයන්ගේ පාද සේදීම

35. ඉශ්‍රායෙල් ජනයා වහල් බවින් මුදවාගෙන ඒමේදී මෝසස් තුමාගේ සහයට දෙවියන් වහන්සේ පත් කළේ,
1) ආරොන් තුමාය.
2) ජොෂුවාය.
3) සාමුවෙල්ය.
4) පූජා මූලිකයන්ය.

36. පුරාණ ගිවිසුමෙහි ඉශ්‍රායෙල් ජනයා නොදවන පූජාවක් සඳහා භාවිතා කළ ද්‍රව්‍යයන් වනුයේ,
1) ගවයන් - කුරුල්ලන් - බැටළුවන් - එළුවන්
2) කොබෙයියන් - පරවියන් - ධාන්‍ය - තෙල් වර්ග
3) පිටි - ධාන්‍ය - තෙල් - මිදියුෂ
4) කිරිඹු පිටි - මිදියුෂ - එළවළු - පලතුරු

37. නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූයේ,
1) විසිතුන්වන ජුවාම් පාවුලු මුනිතුමාය.
2) දෙවන ජුවාම් පාවුලු මුනිතුමාය.
3) හයවන පාවුළු ශුද්ධෝත්තම පියතුමාය.
4) නෙල්සන් මැන්ඩෙලා මහතාය.

38. "යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත." යන තම ආදර්ශ පාඨයට අනුව ක්‍රියා කළේ,
1) තෙරේසා මව්තුමිය
2) ජුසේවාස් පියතුමා
3) දෙවන ජුවාම් පාවුළු මුනිතුමා
4) කොල්බේ මුනිතුමා

39. "විශ්වාසයේ පියා" යන විරුදාවලිය ලැබුවේ,
1) ආබ්‍රහම් තුමාය.
2) ජාකොබ් තුමාය.
3) මෝසස් තුමාය.
4) ජෝශප් තුමාය.

40. පළමු පණතට විරුද්ධ ක්‍රියාවකි,
1) අන් අයගේ හොඳ නම කෙලසීම.
2) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී නොවීම.
3) අංජනම් බැලීම හා නැකත් බැලීම
4) දෙමාපියන් නොසලකා හැරීම.

Remove Watermark Now
pdfelement

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) 1. ශු. බයිබලයට අයත් නීති පොත් දෙකක් නම් කරන්න.
2. ශු. බයිබලයේ පැරණි ගිවිසුමට අයත් ජනප්‍රිය ඓතිහාසික කෘතීන් දෙකක් නම් කරන්න.
3. ශු. පාවුලුතුමා හසුන් ලිවීමේ පරමාර්ථ දෙකක් දක්වන්න.
4. එළිදරව් සාහිත්‍යයට අයත් සත්ව සංකේත දෙකක් නම් කරන්න.
5. පේදුරුතුමාගේ මහා ප්‍රකාශය ලියන්න.
6. ශුද්ධවූ සභාවේ ලක්ෂණ දෙකක් දක්වන්න.
7. පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.
8. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ව පූර්ව සලකුණු දෙකක් දක්වන්න.
9. පුරාණ ගිවිසුමේ ජනයා යාග පැවැත්වීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
10. ශු. තෙරේසා මව්තුමිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

02) 1. ද්විත්ය පාවුලු සංදේශ නම් කරන්න.
2. දෙවන ධර්මදූත චාරිකාවට පාවුලුතුමන් හා එක් වූ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.
3. වර්තමානයේ දේව වචනයේ සාක්ෂිකරුවන් වීමට ඔබට කළ හැකි ක්‍රියා පහක් දක්වන්න.

03) 1. පෙන්තකොස්ත දින සිදුවූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.
2. මුල් ක්‍රිස්තියානි සභාවේ ලක්ෂණ තුනක් දක්වන්න.
3. ඔබගේ මීසම තුළ ක්‍රියාකාරී වන දයා සේවා ආයතන පහක් නම් කරන්න.

04) 1. පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම නම් කර පැමිණි වර්ෂය ලියන්න.
2. ජුසේවාස් පියතුමා සිදුකළ ප්‍රාතිහාර්යයන් තුනක් ලියන්න.
3. ජුසේවාස් පියතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ලබාගත හැකි මඟපෙන්වීම් පහක් ලියන්න.

05) 1. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
2. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද තුනක් දක්වන්න.
3. ඔබගේ ජීවිතය තුළ ප්‍රඥාවන්තව කටයුතු කළ අවස්ථා දෙකක් විස්තර කරන්න.

06) 1. නව ගිවිසුමේ කල්වාරි යාගය උතුම් වීමට හේතු දෙකක් ලියන්න.
2. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග තුනක් දක්වන්න.
3. දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වීමට කළ හැකි දේවල් පහක් ලියන්න.

07) 1. ආරම්භක ප්‍රසාද නිධාන දෙකක් නම් කරන්න.
2. උපස්ථායකයින් තෝරා ගැනීමේ දී සලකා බැලූ විශේෂ කරුණු තුන ලියන්න.
3. ශුද්ධ වූ සභාවේ ව්‍යාප්තිය සඳහා ඔබගේ දායකත්වය කරුණු පහකින් දක්වන්න.

papers.lk pdfelement Remove Watermark Now